ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය : පැය 01 යි |
|---|---|---|

<u>සැලකිය යුතුයි</u>

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

**1)** මහා වංශයෙහි අර්ථ විවරණය සඳහා රචනා කොට ඇති ග්‍රන්ථය මින් කුමක්ද?
1. සීහලට්ඨකථා මහාවංශ  2. වංසත්ථප්පකාසිනිය  3. සමන්තපාසාදිකාව  4. රසවාහිනිය

**2)** ගල් යුගයේ ප්‍රජාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි අත්තනගොඩ අළුලෙන පිහිටා ඇත්තේ කුමන පරිසර කලාපයකට අයත්වද?
1. අර්ධ ශුෂ්ක කලාපයට  2. පහතරට වියළි කලාපයට
2. පහතරට අතරමැදි වියළි කලාපයට  3. තෙත් කලාපයට

**3)** මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස ව්‍යාප්තව පැවති ප්‍රදේශ පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය වන්නේ,
1. ගල් ගුහාවල ව්‍යාප්තියයි  2. සෙල්ලිපිවල ව්‍යාප්තියයි
3. මහ වැව්වල ව්‍යාප්තියයි  3. කුඩා වැව්වල ව්‍යාප්තියයි

**4)** දේවානම් පියතිස්ස රජ දවස දේශපාලන බලය මධ්‍යගත වීමේ අවශ්‍යතාවය වර්ධනය වීමට බලපෑ වැදගත් ම සාධකය මින් කුමක්ද?
1. සියලුම ප්‍රාදේශීය පාලකයන් අතර සුහදතාවය ගොඩනැගීමට
2. අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පැවති සබඳතා වර්ධනය කිරීමට
3. ඉන්දියන් සාගර කලාපයේ වර්ධනය වූ වෙළඳාමට ස්වාධීනව සම්බන්ධ වීම
4. පංචකකුධ භාණ්ඩ භාවිතා කරමින් නැවත අභිෂේකය ලැබීමට

**5)** රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට හිමිවීම පිළිබඳව දිය හැකි උදාහරණය කුමක්ද?
1. දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට  2. වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජුට
3. දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජුට  4. යසලාලකතිස්ස රජුගෙන් පසු සුභ රජුට

**6)**
- ළමා කාලයේ වනගතව රැකවරණය සලසා ගැනීම
- චෝළ පාලකයින් පරදා රට එක්සත් කිරීම
- ඉන්දියන් සාගරයේ නැගෙනහිර කොටස සමග සබඳතා පැවැත්වීමට පරිපාලනය සංවිධානය කිරීම.
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත සඳහන් තොරතුරුවලට ගැළපෙන රජතුමා කවුරුන්ද?
1. දුටුගැමුණු රජු  2. වසභ රජු
3. පළමුවන විජයබාහු රජු  4. පළමුවන පරාක්‍රමබාහු රජු

**7)** ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට දායකත්වය ලබා දුන් රජවරු පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. පස්වන මහින්ද රජු, බුද්ධදාස රජු, හතරවන කාශ්‍යප රජු
2. භාතිකාභය රජු, පළමුවන ගජබාහු රජු, වසභ රජු
3. වසභ රජු, හතරවන කාශ්‍යප රජු, පළමුවන උපතිස්ස රජු
4. පස්වන මහින්ද රජු, බුද්ධදාස රජු, තුන්වන උදය රජු

**8)** පහත දී ඇති **"අ"** තීරුවේ විවිධ ශිල්පීන් හා **"ආ"** තීරුවේ ඔවුන් පිළිබඳව සඳහන්වන සෙල්ලිපි දක්වා ඇත. ඒවා නිවැරදිව ගැළපූ විට පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. කම්මල්කරුවන් | A. මණ්ඩගල සෙල්ලිපිය |
| 2. ඇත්දත් ශිල්පීන් | B. වෙහෙරකෙම සෙල්ලිපිය |
| 3. රන්කරුවන් | C. මුතුගල්ල සෙල්ලිපිය |
| 4. නූල්කටින්නන් | D. සීගිරි ජල උද්‍යාන සෙල්ලිපිය |
| | E. වේගිරිය දේවාල සෙල්ලිපිය |

1. CAED 2. CEAB 3. ACBE 4. BCAE

**9)** වෙළදාමේ සාර්ථකත්වය සඳහා චීනය සමග වඩාත් ශක්තිමත් සබඳතා ගොඩනගා ගත් රජු කවුරුන්ද?

1. හයවන අග්ගබෝධි රජු
2. පස්වන කාශ්‍යප රජු
3. දෙවන කාශ්‍යප රජු
3. දෙවන අග්ගබෝධි රජු

**10)** ආභරණ සැකසීමේ තාක්ෂණික විශිෂ්ටත්වය විදහාපාන සියුම් කැටයම් සහිත රන්තැල්ලක කොටසක් හමුවී ඇත්තේ කුමන ස්ථානයෙන්ද?

1. මහා විහාරයෙන්
2. අභයගිරි විහාරයෙන්
3. ගල් විහාරයෙන්
3. ජේතවන විහාරයෙන්

**11)** ගමික සතු කාර්යයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ගම් අතර විවිධ සම්බන්ධතා පවත්වාගෙන යාම
2. ගම වෙනුවෙන් තීරණ ගැනීම
3. පොදු වැඩවලට නායකත්වය දීම
4. ඉහත සඳහන් සියල්ලම ය.

**12)** පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. වියළි කලාපයේ වසර පුරාම ජලය සපයාගත නොහැකි වුවද පසේ සාරවත් බව නිසා මුලික ජනාවාස එම ප්‍රදේශවල ව්‍යාප්ත විය.
2. ගමිකයන් ගෘහපතින් අතරින්ම පත්වූ කෙනකු බව බුද්ධඝෝෂ හිමි සමන්ත පාසාදිකාවේ සඳහන් කර ඇත.
3. දේවානම්පියතිස්ස රජු ලංකාවේ ප්‍රථම බෞද්ධ රජු මෙන්ම දෙවතාවක් අභිෂේක කළ එකම රජු වේ.
4. ලංකාව ප්‍රථම වරට එක්සේසත් කළේ දුටුගැමුණු රජු ය. රජුට සහය දුන් සෙන්පතිවරු ඊට පෙර පරුමකවරු ලෙස කටයුතු කර නැත.

**13)** ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සහෝදරයාගෙන් සහෝදරයාට හිමි වූ අවස්ථාවකට උචිත නිදසුන වන්නේ,

1. මුටසිව රජුගෙන් පසු දේවානම්පියතිස්ස රජුට රාජ්‍යත්වය හිමි වීම.
2. කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජුට රාජ්‍යත්වය හිමි වීම .
3. දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට රාජ්‍යත්වය හිමි වීම .
4. පණ්ඩුකාභාය රජුගෙන් පසු මුටසිව රජුට රාජ්‍යත්වය හිමි වීම.

**14)** පහත සඳහන් **'අ'** හා **'ආ'** තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. බුද්ධදාස රජු | A. රෝහල්වල පහසුකම් ඇති කිරීම |
| 2. V වන මිහිඳු රජු | B. මාතෘ නිවාස ඇති කිරීම - පසවන්නිනාම සාලා |
| 3. IV වන කාශ්‍යප රජු | C. උණ රෝගීන්ට රෝහල් ඉදිකිරීම - උපසග්ග රෝග නාසා |
| 4. I වන උපතිස්ස රජු | D. සොත්ථි ශාලා - මාතෘ නිවාස |
| | E. **මහත් වෙහෙසක් ගෙන** රෝහල් ඉදිකිරීම |

1. ECAB    2. EACB    3. BECD    4. ADBE

**15)** **'අ'** තීරයේ දැක්වෙන කරුණු හා සම්බන්ධ වරායන් **'ආ'** තීරයේ දැක්වේ. **'අ'** තීරයට අනුව **'ආ'** තීරය ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. අනුරාධපුර යුගයේ අන්තර්ජාතික වෙළඳ වරාය | A ලංකා පටුන |
| 2. පොළොන්නරු යුගයේ වැදගත් වූ වෙළඳ වරාය | B දඹකොළ පටුන |
| 3. හේමමාලා හා දන්ත කුමරු | C ගෝකණ්ණ වරාය |
| 4. ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩමවීම | D මහා තිත්ථ වරාය |

1. ABDC    2. ADCB    3. DCAB    4. CDAB

**16)** කිසිදු සතෙකු නොමැරිය යුතුය. යන **'මාඝාත නීතිය'** පනවන ලද හඳුන්වා දුන් රජතුමා වන්නේ,

1. ආමණ්ඩ ගාමිණි අභය රජු
2. නිශ්ශංකමල්ල රජු
3. IV මිහිඳු රජු
4. V වන කාශ්‍යප රජු

**17)** III උදය රජු ස්ථාපිත කළ බුද්ධන්නේහෙළ සෙල්ලිපියේ සඳහන් වන්නේ,

1. කැළෑවේ ගස් කොළන් නොකැපිය යුතුය යනුවෙනි.
2. වනාන්තර කළමනාකරණය කළ යුතුය යනුවෙනි.
3. ඇළ මාර්ගවල කුඩා මසුන් නොමැරිය යුතුය යනුවෙනි.
4. වගුරුබිම් ආශ්‍රිත පක්ෂීන් නොමැරීම කළ යුතුය යනුවෙනි.

**18)** සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරාගෙන අනුරාධපුර රාජධානිය ගොඩනැගීම සිදුකළ රජතුමා වන්නේ,

1. දේවානම්පියතිස්ස රජු
2. පණ්ඩුකාභය රජු
3. දුටුගැමුණු රජු
4. සීගිරි කාශ්‍යප රජු

**19)** පහත සඳහන් **'අ'** හා **'ආ'** තීරු ගැළපූ විට නිවැදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා | A දෙවන සංකිලි |
| 2. යාපන රාජ්‍යයේ අවසාන පාලකයා | B පරරාජසේකරම් |
| 3. පෘගුගීසින් එන විට යාපනයේ පාලකයා | C පළමු සංකිලි |
| 4. වීදිය බණ්ඩාරට රැකවරණය සැලසූ යාපන පාලකයා | D විජය කුලංකෙ |

1. DABC 2. CADB 3. BCDA 4. ACDB

**20)** පහත සඳහන් සේවාවන් ඉටුකළ රජතුමා වන්නේ,

- රටේ අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවලට කළ සේවය නිසා සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ඇතිවීම.
- සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.
- උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම.
- අවසන් වරට ලංකාව එක්සේසත් කර ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම.

1. IV පරාක්‍රමබාහු රජු 2. VI පරාක්‍රමබාහු රජු
3. II පරාක්‍රමබාහු රජු 4. I පරාක්‍රමබාහු රජු

**21)** මහනුවරණ රාජධානියේ පරිපාලන සංවිධානය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. මහනුවර පරිපාලන සංවිධානයේ ඉහළම පුද්ගලයා වූයේ රජුය.
2. මහනුවර ප්‍රාදේශීය පාලන සංවිධානය රට හා දිශාව ලෙස කොටස් දෙකකින් පමණක් සමන්විත විය.
3. මහනුවර යුගයේ සමාජ සම්බන්ධතා කුල ක්‍රමය අනුව සිදුවිය.
4. දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුල, බද්දේ සංවිධානය ලෙස හැඳින්විණි.

**22)** පෘතුගීසීන් වෙත පලාගොස් දොන් පිලිප් නමින් බෞතිස්ම කරනු ලැබූ උඩරට ප්‍රභූවරයා
1. කරලියද්දේ බණ්ඩාර 2. වීරසුන්දර බණ්ඩාර
3. යමසිංහ බණ්ඩාර 4. ජයවීර බණ්ඩාර

❖ **A සිට J දක්වා තොරතුරු ඇසුරින් 23, 24 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| වර්ෂය | යුරෝපීය දූතයා | හමු වූ පාලකයා |
|---|---|---|
| A – 1505 | D - ජොරිස් වැන් ස්පිල්බර්ජන් | G - අටවන වීර පරාක්‍රමබාහු රජු |
| B – 1602 | E - ලොරෙන්සෝ ද අල්මේදසා | H - කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| C – 1762 | F - ජෝන් ෆයිබස් | J - පළමුවන විමලධර්මසූරිය රජු |

**23)** පෘතුගිසීන්ගේ ප්‍රථම දූත ගමන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
1. BDG 2. AFH 3. CEJ 4. AEG

**24)** උඩරට රාජධානිය සමග පැවැත්වූ ලන්දේසි දූත සබදතාව පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. BDH 2. BDJ 3. CFH 4. AEG

**25)** බුදු දහම වැළඳ වැලිවිට ශ්‍රී සරණංකර හිමිගේ උපදෙස් පරිදි බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා උත්සාහ ගත් නායක්කාර් වංශික රජු වන්නේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
2. පළමු විමලධර්මසූරිය රජු
3. ශ්‍රී විජය රාජසිංහ රජු
4. රාජාධි රාජසිංහ රජු

**26)** ක්‍රි. ව. 1548 දී සීතාවක මායාදුන්නේ රජු සමඟ සන්ධානයකට පැමිණි යාපන පාලකයා වන්නේ,

1. පරරාජසේකරම්
2. කුලශේකරම්
3. එදිරිමානසිංහම්
4. පළමු සංකිළි

❖ **පහත දක්වා ඇති තොරතුරු ඇසුරින් 27, 28 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A. කාරක සභා සභාපති
B. අමද්‍යප උද්ඝෝෂණ ව්‍යාපාරය
C. මුදල් ලේකම්
D. ලංකා ජාතික සංගමය
E. ලංකා ස්වාධිනතා පනත

**27)** ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට පමණක් අදාළ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. A හා C 2. C හා E 3. A හා D 4. C හා B

**28)** මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමයේ සිදු වු විශේෂ සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. C හා D 2. B හා D 3. E හා B 4. D හා A

**29)** මදුරාසි පාලනය යටතේ පත්කළ අවුමිල්දාර්වරුන්ට පැවරුණු කාර්යය වන්නේ,

1. අධිකරණ කටයුතු සිදු කිරීම.
2. මුහුදුබඩ ප්‍රදේශ පාලනය
3. බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියෙන් මිලදී ගැනීම.
4. මුහුදුබඩ ප්‍රදේශවල බදු ආදායම් එකතු කිරීම.

**30)** A - සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේග ඒකරාශි වීම.
B - සහල් මිල ඉහල යාම නිසා වාමාංශික පක්ෂ මෙහෙය වු හර්තාල් ව්‍යාපාරය නිසා 1953 දී අගමැති තනතුරින් ඉල්ලා අස්වීම.
C - ලොව ප්‍රථම අගමැතිනිය ලෙස පතක්වීම.

ඉහත සිදුවීම් හා සම්බන්ධ අගමැතිවරුන් පිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1. ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
2. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, සිරිමාවෝ බණ්ඩාරනායක
3. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක
4. ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක

**31)** කඩිනම් මහවැලි යටතේ ඉදිකළ ජලාස **(අ)** තීරුවේ ද, ඒ සඳහා ආධාර ලබාදුන් රටවල් **(ආ)** තීරුවේද දැක්වේ. **(අ)** තීරුවට අනුව **(ආ)** තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. කොත්මලේ ජලාශය | A. බටහිර ජර්මනිය |
| 2. වික්ටෝරියා ජලාශය | B. ස්වීඩනය |
| 3. රන්දෙණිගල ජලාශය | C. බ්‍රිතාන්‍යය |
| | D. චීනය |

1. DBC  2. CBA  3. BCA  4. ACB

**32)** බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමේ ප්‍රබල ව්‍යාපාරය වූයේ මිෂනාරි ව්‍යාපාරයයි. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මිෂනාරී කටයුතු සිදුකළ මිෂනාරී සමාගම වන්නේ.

1. වෙස්ලියන් මිෂනාරී සමාගම  2. ඇමරිකානු මිෂනාරී සමාගම
3. චර්ච් මිෂනාරී සමාගම  4. ලන්ඩන් මිෂනාරීසමාගම

**33)** පුනරුදය ඇති වීමට බලපෑ ප්‍රධානම හේතු වන්නේ,

1. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව
2. වෙළඳාම දියුණු වීම හා ධනවතුන් බිහි වීම.
3. කොන්ස්තන්තිනෝපාලය තුරුකී මුස්ලිම්වරුන්ට අත්වීම.
4. බුද්ධි ප්‍රබෝධය

**34)** අප්‍රිකා මහද්වීපයේ සුභ පැත්මේ තුඩුව සොයාගත් දේශ ගවේෂකයා වන්නේ

1. වස්කෝද ගාමා  2. බර්තොලමියු ඩයස්
2. ක්‍රිස්ටෝපර් කොලොම්බස්  4. ෆර්ඩිනන්ඩ් මැගලන්

**35)** කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිකළ වෙනස්කමක් දැක්වෙන පිළිතුර වන්නේ,

1. නගර සංඛ්‍යාව විශාල වීම
2. බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම
3. පන්ති සහිත සමාජයක් බිහිවීම
4. කම්කරු වැඩ වර්ජන ඇරඹීම හා වෘත්තීය සංගම් බිහිවීම.

❖ **පහත A, B, C, D වලින් දැක්වෙන ප්‍රකාශ/ පද යුගල අධ්‍යයනය කර 36 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. ඇමරිකානු විප්ලවය
2. බෝස්ටන් තේ සාදය

B - 1. වී අයි. ලෙනින්
2. සමාජවාදය

C - 1. ඔටෝවොන් බිස්මාර්ක්
2. විලියම් කෙසර්

D - 1. ජපානය යටත්වීම
2. දෙවන ලෝක මහා සංග්‍රාමය

**36)** පළමුවැන්න නිසා දෙවැන්න අවසන් වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A  2. B  3. C  4. D

**37)** දෙවැන්නේ වර්ධනය නිසා පළමුවැන්න ඇති වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A    2. B    3. C    4. D

**38)** දෙවැන්න නිසා පළමුවැන්නේ ක්‍රියා කලාපය ප්‍රතිඵල රහිත වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A    2. B    3. C    4. D

**39)** සෝවියට් දේශයේ මග පෙන්වීම මත සමාජවාදී බල කඳවුරට සම්බන්ධ වු රටවල් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

1. බටහිර ජර්මනිය, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව
2. හංගේරියාව, නැගෙනහිර ජර්මනිය, පෝලන්තය
3. පෘතුගාලය, නෙදර්ලන්තය, ඉතාලිය
4. ග්‍රීසිය, පෝලන්තය, ප්‍රංශය

**40)** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයට අයත් නිශේධ බලය හිමි රටවල් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. ඉන්දියාව, චීනය, ඇමෙරිකාව, ප්‍රංශය, ඉතාලිය
2. චීනය, ඇමරිකාව, රුසියාව, කැනඩාව, ඉන්දියාව
3. චීනය, ප්‍රංශය, ඇමරිකාව, රුසියාව, බ්‍රිතාන්‍යය
4. බ්‍රිතාන්‍යය, ජර්මනිය, ප්‍රංශය, රුසියාව, ඉංදියාව

(ල. 2 x 40 = 80)

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ஊவா மாகாண கல்வித் திணைக்களம்

Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය II | කාලය පැය 3 යි |
| --- | --- | --- |

**සැලකිය යුතුයි.**

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II, III යනුවෙන් කොටස් 3 කි.**
- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර II, කොටසින් ප්‍රශ්න හතරක් ද, III කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරා ගෙන පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.**

## I - කොටස

**1)** පහත (I) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද (II) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද නිවැරදිව ලකුණු කොට නම් කරන්න.

අ) I. ඌරාතොට, යාන්ඔය, නාච්චාදූව වැව, මහියංගනය, දීඝවාපිය, බුත්තල, කදුරුගොඩ, කාවරගාම, ඇළහැර අමුණ, කොළඹ, යෝධ වැව, සීගිරිය

II. කළු මුහුද, මක්කම, පිලිපීන දූපත්, ඕලන්දය (නෙදර්ලන්තය) , බොම්බාය, හිරෝෂිමා

(ලකුණු 18)

ආ) (i) පහත A,B,C,D යටතේ දක්වා ඇති තොරතුරු වලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් නිවැරදිව ලියන්න.

A. කුණාටුවකට හසුව අහඹු ලෙස ශ්‍රී ලංකාවට ගොඩබට පෘතුගීසි ජාතිකයා වන්නේ

B. බෙලිගල නම් ස්ථානයේ දළදා මාළිගාවක් නිර්මාණය කර දළදා වහන්සේ තැන්පත් කළ රජු වන්නේ,

C. එක්සත් ජාතින්ගේ සංවිධානය නිර්මාණය කිරීම සඳහා මුල් වූ රුසියානු නායකයා වන්නේ,

D. 1795 දී ලන්දේසීන් සතුව පැවති ත්‍රිකුණාමල් වරාය අල්ලා ගැනීමෙන් පසු රාජාධි රාජසිංහ රජු හමුවූ ඉංග්‍රීසි ජාතිකයා වූයේ.

(ලකුණු 04)

(ii) A හා B යටතේ දක්වා ඇති රූප සටහන් වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- i. මෙම ප්‍රතිමාව කුමන රජුගේද?

ii. මෙම ප්‍රතිමාව දැකිය හැක්කේ කුමන ස්ථානයේද?

iii. මෙතුමාගේ කාලයේ තානාපති සම්බන්ධතා පැවැත්වූ රට කුමක්ද?

iv. එම රටින් මෙරටට රැගෙන එන ලද වටිනා ද්‍රව්‍ය කුමක්ද?



A

(ලකුණු 04)

B- i. මෙම පින්තූරයේ සිටින තැනැත්තා කවුරුන් ද?

ii. මොහුගේ අදහස් බලපානු ලැබුවේ කවර විප්ලවයක් සඳහා ද?

iii. ඉහත විප්ලවයට අදාළ වන සේ මොහු ඉදිරිපත් කළ අදහස කුමක් ද?

iv. ඉහත විප්ලවයට බලපෑ තවත් දාර්ශනික මතවාදයක් ඉදිරිපත් කළ පුද්ගලයෙකු සඳහන් කරන්න.



B

(ලකුණු 04)

## II කොටස

**2)**

i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වු පහතරට තෙත් කලාපිය ලෙන් තුනක් නම් කරන්න. **(ලකුණු 03)**

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කළ අභිචාර විධි ක්‍රම දෙකක් නම් කරන්න. **(ලකුණු 04)**

iii. *a.* පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී පෙනෙන සාධක තුනක් ද,

*b.* මුල් ඓතිහාසික යුගයේ බිහි වු වාපි ගම් දෙකක් ද නම් කරන්න. **(ලකුණු 05)**

**iv.** මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

**3)**

i. රජවරුන්ගේ ක්‍රියාකලාපය අනුව පහත රාජ්‍යත්ව සංකල්ප ආරෝපණය වු රජවරු වරහන් තුළින් තෝරා ලියන්න.

A. දේවත්ව

B. පර්වතරාජ

C. චක්‍රවර්ති

( IV වන කාශ්‍යප, නිශ්ශංකමල්ල, කූටකණ්ණ අභය, I වන කාශ්‍යප, බුද්ධදාස) **(ලකුණු 03)**

ii. පහත සඳහන් එක් එක් කරුණු හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A. ප්‍රාදේශීය පාලකයන් කිහිපදෙනකු හා සටන් කොට අනුරාධපුර රාජධානිය ගොඩනගා රජ බවට පත් වීම.

B. ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට කතරගම හා චන්දනගම ක්ෂත්‍රියන්ට ආරාධනා කළ රජු

C. රට ආස්ථානවලට බෙදා එවා පාලනයට වෙනම ඇමතිවරු පත් කළ රජු

D. පරුමකවරුන් ලෙස කටයුතු කළ අයට මධ්‍ය පාලනයේ සේනාපති තනතුරු පිරිනැමීම. **(ලකුණු 04)**

**iii.** පොදු සෞඛ්‍ය පහසුකම් නගාසිටුවීම සඳහා පැරණි පාලකයන් කටයුතු කළ ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. **(ලකුණු 05)**

**iv.** I වන විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක මඟින් විස්තර කරන්න. **(ලකුණු 06)**

**4)**

i. ජලය රැගෙන යාම සඳහා පැරැන්නන් විසින් ඉදිකළ ප්‍රධාන ඇළ මාර්ග තුනක් නම් කරන්න. **(ලකුණු 03)**

ii. ජල කළමණාකරනයේ උසස්ම නිර්මාණය වන්නේ වැවයි. පහත A,B,C,D වලින් දක්වා ඇත්තේ වැවක ප්‍රධාන කොටස් කිහිපයකි. ඒවායින් කෙරෙන කාර්යයන් මොනවාදැයි ලියන්න.

*A.* සොරොව්ව

*B.* රළපනාව

*C.* වැව්බැම්ම

***D.*** පිටවාන **(ලකුණු 04)**

**iii.** අතීත ශ්‍රී ලංකාවේ අපේ මුතුන් මිත්තන් සතුව පැවති මැනීම හා ගණනය පිළිබඳ දේශීය දැනුම, කරුණු දෙකකින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

iv. අතීතයේ දියුණු වාස්තු විද්‍යාත්මක ක්‍රම අනුගමනය කළ බවට සාක්ෂි උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

**5)**

i. පහත සඳහන් රජවරු පාලනයට පත්වු රාජධානිය වරහන් තුළින් තෝරා A,B,C, අනුපිළිවෙලින් ලියන්න.

*A.* II පරාක්‍රමබාහු රජු

*B.* IV පරාක්‍රමබාහු රජු

*C.* VI පරාක්‍රමබාහු රජු

(කුරුණෑගල, දඹදෙණිය, කොට්ටේ) **(ලකුණු 03)**

ii. දෙවන නාගරීකරණයට අයත් රාජධානි හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. 13 - 15 සියවස් අතර කාලයේ මෙරට රාජධානි ගොඩනැගීමේ දී කැපී පෙනුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. කෝට්ටේ රාජධානියේ පරිහානියට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

6)

i. පහත නම් සඳහන් පුද්ගලයන් රාජ්‍යත්වයට පත් වූයේ කුමන නමකින්දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

*A.* කන්නසාමි

*B.* මහා අස්ථාන

*C.* කොනප්පු බණ්ඩාර

(II වන රාජසිංහ, ශ්‍රී වික්‍රමරාජසිංහ , I වන විමලධර්මසූරිය) (ලකුණු 03)

ii. පෘතුගීසින් උඩරට ආක්‍රමණය කළ පහත සටන් සඳහා නායකත්වය ගත් මෙරට රජවරු දෙදෙනා ලියන්න.

*A.* ගන්නෝරුව සටන

*B.* බලන සටන (ලකුණු 04)

iii. මහනුවර රාජධානියේ පැවති ආර්ථික ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. මහනුවර රාජධානිය පෘතුගීසි හා ලංදේසීන්ට යටත් කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 06)

7)

i. ප්‍රංශ ජාතීන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන පමණක් වරහන් තුළින් තෝරා ලියන්න. (සූරාත්, කරිකාල්, පොන්ඩිචෙරි, බොම්බාය, චන්දනගර්, කල්කටා) (ලකුණු 03)

ii. ක්‍රි.ව. 1815 දෙවන උඩරට ආක්‍රමණය සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. වතු වගාවේ දියුණුව සඳහා බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. නිදහසින් පසු මෙරට ආර්ථිකයේ කැපී පෙනුන ලක්ෂණ තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

8)

***i.*** ඇමරිකාවේ පිහිට වූ බ්‍රිතාන්‍ය ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03)

*ii.* පහත ABCD යටතේ දැක්වෙන ප්‍රකාශනවලට අදාළ තොරතුරු සපයන්න.

*A.* ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය

*B.* ඇමරිකානු ජනපදවලට නව බදු පැනවූ අගමැතිවරයා

*C.* බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකාව ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගත් ගිවිසුම

***D.*** නිදහස් ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා (ලකුණු 04)

*iii.* ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු දෙකක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05)

***iv.*** ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

9)

***i.*** පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ වූ මිත්‍රපිලේ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

***ii.*** පළමුවන ලෝක යුද්ධයට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

***iii.*** ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

***iv.*** එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**
**11 ශ්‍රේණිය**
**ඉතිහාසය I – II (පිළිතුරු පත්‍රය)**

## 1- පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 - **2** | 11 **-4** | 21 **-3** | 31 **-3** |
| 2 - **3** | 12 **-4** | 22 **-3** | 32 **-1** |
| 3 - **4** | 13 **-3** | 23 **-4** | 33 **-3** |
| 4 - **3** | 14 **-2** | 24 **-2** | 34 **-2** |
| 5 **-2** | 15 **-3** | 25 **-3** | 35 **-4** |
| 6 **-3** | 16 **-1** | 26 **-4** | 36 **-4** |
| 7 **-1** | 17 **-1** | 27 **-1** | 37 **-1** |
| 8 **-2** | 18 **-2** | 28 **-2** | 38 **-3** |
| 9 **-1** | 19 **-1** | 29 **-4** | 39 **- 2** |
| 10 **-4** | 20 **-2** | 30 **-2** | 40 **-3** |

## II පත්‍රය

01. (I) සිතියම් පොත ඇසුරු කරගෙන නිවැරදිව ලකුණු කිරීම සිදු කර ඇත්නම් අදාළ ලකුණු ලබා
(II) දෙන්න.
(ආ) (I) A - ලොරෙන්සෝද අල්මේදා
B - පළමුවන විජයබාහු රජු / මහා විජයබාහු රජු
C - ජෝශප් ස්ටාලින්
D - රොබට් ඇන්ඩෲස්
(II) A (I) භාතිකාභය රජුගේ ප්‍රතිමාව
(II) රුවන්වැලි මහා සෑය අභියස
(III) රෝමානුක දේශය / රෝමය

B (I) වෝල්ටෙයාර්
(II) ප්‍රංශ විප්ලවය සඳහා
(III) ස්වාධීන මත ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ අදහස් දැක්වීම
(IV) මොන්ටෙස්කියු / රූසෝ

## II කොටස

02. (i) පාහියන්ගල ලෙන / කුරුවිට බටදොඹලෙන / කිතුල්ගත බෙලිලෙන
(ii) • මියගිය තැනැත්තාගේ ඇටසැකිලි තමා ජීවත් වූ ස්ථානයේම වළ දැමීම
• මියගිත තැනැත්තාගේ හිස්කබලේ ගුරුගල් ආලේපකර වළ දැමීම.
• මියගිය තැනැත්තා වකුටු කොට වළ දැමීම.
(iii) (a) • පිලිස්සූ මැටි වලං තැනීම.
• යකඩ භාවිතයෙන් උපකරණ තැනීම.
• ස්ථිර නිවාස තැනීම / ක්‍රමවත් සුසාන ඉදිකිරීම.
(b) සුමනවාපි ගම / විහාරවාපි ගම / කඩහවාපි ගම

(iv) • වැවක් කේන්ද්‍ර කර ගනිමින් ජනාවාස පිහිටා තිබීම.
• ගංගාවල පිටාර නිම්නයේ ජනාවාස පිහිටා තිබීම.
• වෘත්තිකයන් විසූ ගම් හා කාර්ය පදනම් කොට පිහිටීම වැනි අදාල පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

03. (i) A - කූටකණ්ණ අභය
B - I කාශ්‍යප
C - නිශ්ශංකමල්ල
(ii) A - පණ්ඩුකාභය රජු
B - දේවානම්පියතිස්ස රජු
C - වසභ රජු
D - දුටුගැමුණු රජු
(iii) •මහත් වෙහෙසක් ගෙන රෝහල් ඉදිකිරීම - බුද්ධදාස රජු
•උපසග්ග රෝගනාස රෝහල් තැනීම - හතරවන කාශ්‍යප රජු
•පසවත්නි නාමශාලා රෝහල් තැනීම - පළමුවන උපතිස්ස රජු
ගැලපෙන පිළිතුරු වලට ලකුනු ලබා දෙන්න.
(iv) •චෝලයන් පරදා පොළොන්නරුව ජයගැනීම
• ආර්ථික වශයෙන් රට දියුණු කිරීම.
• විවාහ සබඳතා මඟින් රටේ ආරක්ෂාව තහවුරු කර ගැනීම.

04. (i) ඇළහැර ඇල / මිණිපේ ඇල / යෝධ ඇල
(ii) A - ප්‍රයෝජනය සඳහා වැවේ ජලය ඇලමාර්ගවලට මුදා හැරීම.
B - සුළඟ නිසා ඇති වන ජල තරංගවලින් වැව් බැම්ම සේදීයාම වැළැක්වීම.
C - විශාල ජල ධාරිතාවක් රඳවා තබා ගැනීම.
D - වැසිකාලවල දී වැවට එකතු වන අතිරික්ත ජලය පිටකිරීම.
(iii) •අවකාශය මැනීමට ඒකක පැවතීම.
•කෙට්දුර මැනීමට ඒකක පැවතීම ආදි ප්‍රමාණවත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(iv) • රුවන්වැලි මහාසෑයේ අත්තිවාරම ශක්තිමත් ලෙස සැකසීම.
• විශාල ප්‍රමාණයේ තට්ටු නිවාස සකසා තිබීම.
• විශාල ආගමික ගොඩනැගිලි ප්‍රමාණයක් ඉදිකර තිබීම.
•රජමාලිගා / බලකොටු / ආගමික නොවන ප්‍රභූ නිවාස ආදි අදාල පිළිතුරු ඇත්නම් ලකුණු දීම.

05. (i) A - දඹදෙණිය
B - කුරුණෑගල
C – කෝට්ටේ
(ii) දඹදෙණිය / යාපහුව / කුරුණෑගල / ගම්පල / කෝට්ටේ / මහනුවර
(iii) • ජ්‍යාමිතික සැලසුම් ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයකට ගොඩනගා තිබීම.
• ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබීම.
• අහස් දියෙන් ගොවිතැන් කළ හැකි ස්ථානවල පිහිටුවා තිබීම.
• රාජධානි විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී නොතිබීම.
(iv) • විජයබා කොල්ලය ඇතිවීම.
• ධර්මපාල රජුගේ ක්‍රියාකලාපය
• පාලකයන් අතර ඇති වූ අසමගිය
• පෘතුග්‍රීසීන්ට පක්ෂපාති පාලකයන් බිහිවීම.

06. (i) A - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
B - දෙවන රාජසිංහ රජු
C – පළමුවන විමලධර්මසූරිය රජු
(ii) A – II රාජසිංහ රජු
B - I විමලධර්මසූරිය රජු
(iii) • කෘෂිකර්මාන්තයට ප්‍රධාන තැනක් හිමිවීම.
• ස්වයංපෝෂිත කෘෂිකර්මාන්තයක් පැවතීම.
• කුඹුරු පොල්මළු ක්‍රමයට සකස් කර තිබීම.
• හේන් ගොවිතැනට ප්‍රධාන තැනක් හිමිවීම.
• ගෙවතු වගාව දක්නට ලැබීම ආදි ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

07. (i) පොන්ඩිචේරි / කරිකාර් / චන්දනගර්
(ii) • උඩරට ජනතාව හා රදළ ප්‍රධානීන් ඉංග්‍රීසින්ට සහාය දීම.
• ජෝන් ඩොයිලිගේ උපායශීලි ප්‍රතිපත්තිය
• උඩරට රජුගේ කෲර පාලන ප්‍රතිපත්තිය
(iii) • රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.
• ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
•රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
(iv) • වී වගාව දියුණු කිරිමට ගොවිජනපද පිහිටුවීම.
• ව්‍යාපාරික කෘෂිකර්මාන්තය දියුණු කිරීමට පියවර ගැනීම.
• සුළු අපනයන බෝග වගාව දියුණු කිරීම
• කාර්මික දියුණුව ඇතිකිරීමට පියවර ගැනීම.

08. (i) වර්ජිනියා / මේරිලන්ඩ් / නිව්ජර්ස් / ජෝර්ජියා
(ii) A - නියෝජනයක් නැත්නම් බදුන් නැත
B - ජෝර්ජ් ග්‍රෑන්විල
C – 1783 දී ......... පැරිස් සාම ගිවිසුම
D - ජෝර්ජ් වොෂින්ටන්
(iii) •රජුගේ සහ රජ පවුලේ සුඛෝපබෝගී ජීවිතය සඳහා වැය වූ වියදම්
• අනවශ්‍ය යුධ වියදම්
•අසාධාරණ බදු පැනවීම.
(iv) •ඇමරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍ය බිහිවීම.
• ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීමත
• මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇතිවීම.

09. (i) බ්‍රිතාන්‍ය / ප්‍රංශය / රුසියාව / ඇමරිකාව
(ii) • දෙවන විලියම් කෙයිසර්ගේ ක්‍රියාකලාපය
• යටත් විජිත සඳහා වූ තරඟය
• අවිකරනය හා ජාතිවාදය වර්ධනය වීම.
• ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් කුමරු ඝාතනය කිරීම. (සරයේවෝ සිද්ධිය)
(iii) •ඇමරිකාව ජාතීන්ගේ සංගමයේ සාමාජික නොවීම.
• ජාතීන්ගේ සංගමයේ සාමාජිකයන් අතර එකමුතුකමක් නොමැතිවීම.
• සාම සාධක හමුදාවක් නොමැතිවීම.
(iv) • සූවස් අර්බුධය විසඳීම.
• ගල්ෆ් අර්බුදය විසඳීම.
• කියුබානු මිසයිල අර්බුදය විසඳීම.


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440